# මූලික පරීක්ෂණ උසාවි

යම්කිසි සිදුවීමක් සම්බන්ධයෙන් ස්ථිර නිගමනයකට එලඹීමට නොහැකි අවස්ථාවකදී ඒ පිළිබඳ කරුණු සොයා බලා වාර්ථා කිරීම සඳහා පත්කරනු ලබන මණ්ඩලය මූපඋ වේ. යුධ හමුදාවේ මුපඋ උසාවි 1952 මුපඋ රෙගුලාසින්ට යටත්ව සිදුකරනු ලැබේ.

**<u>මූලික පරීක්ෂණ උසාවි පැවැත්වීමට හේතු:</u>**

යම්කිසි සිදුවීමක් සැබැඳිව එක්වරම ස්ථිර නිගමනයකට පැමිණීමට නොහැකි අවස්ථාවක එම සිදුවීම සැබැඳිව කරුණු විමසා පරීක්ෂා කර නිගමනයකට එළඹීම සඳහා මුපඋ පවත්වනු ලැබේ.

**<u>මූලික පරීක්ෂණ උසාවියක් පත්කිරීමට බලය ඇති නිළධාරින්:</u>**

අ. යුද්ධ හමුදාධිපති

ආ. අධ්‍යක්ෂවරුන්, බළසේනා ආඥාපතිවරුන් හෝ ඒ වෙනුවට වැඩබලන නිළධාරින් (ආරක්ෂක සේනා ආඥාපතින්, සේනාංකාධිපතිවරුන්)

ඇ. සේනාවිධායකවරුන්

ඈ. බළකාධිපතිවරුන්

ඉ. ඒකක අණදෙන නිළධාරිවරුන්

ඊ. නිළධාරි අණදෙනවරුන්

**<u>මූලික පරීක්ෂණ උසාවියක සංයුතිය:</u>**

අ. මූලික පරීක්ෂණ උසාවියක් අධිකාරිලත් නිළධාරියෙකුගේ සභාපතිත්වයෙන් යුක්ත විය යුතුයි. එය තවත් දෙදෙනකු හෝ තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර, එම සාමාජිකයින් නි/බලලත් නිළධාරින්/ජ්‍යෙෂ්ඨ කොනොනියෙකු අවශ්‍යතාවයේ වැදගත්කම අනුව විශේෂඥ නිළධාරින් මණ්ඩලයට ඇතුලත් කල හැක.

ආ. මූලික පරීක්ෂණ උසාවිය පත්කරන නිළධාරියාගේ අභිමතය පරිදි පරීක්ෂා කරනු ලබන කරුණු නාවික/ගුවන් හමුදාවට සම්බන්ධතාවයක් දක්වන අවස්ථාවක අදාල නිළධාරින්ගේ කැමැත්ත අනුව මුපඋ හි සාමාජිකයින් වශයෙන් එක් එක් හමුදාවන්හි නිළධාරින් පත්කල හැකි අතර, එවන් අවස්ථාවක සභාපතිත්වය ඉසිලිය යුත්තේ යුද හමුදා නිළධාරියෙකු විසිනි.

ඇ. මූලික පරීක්ෂණ උසාවි පත්කරන නිළධාරියා විසින් ඊට සභාපතිවරයෙකු නම්කල යුතු අතර, එවැනි නම් කිරීමක් නොමැති විට සිටින ජ්‍යෙෂ්ඨ නිළධාරියා සභාපති ලෙස කටයුතු කල යුතුවේ.

ඈ. මූලික පරීක්ෂණ උසාවි සඳහා සභාපතිවරයෙකු නම්කර ඇති අවස්ථාවක ඔහුට වඩා ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු එම මූලික පරීක්ෂණ උසාවියේ සාමාජිකයෙකු වශයෙන් නම් නොකළ යුතුවේ. එමෙන්ම මූලික පරීක්ෂණ උසාවිය පත්කරන අවස්ථාවේදීම එමගින් සොයාගත යුතු කරුණු සම්බන්ධයෙන් පැහැදිලි විස්තරයක් කැඳවීමේ නියෝගයට ඇතුලත් කල යුතුවේ.

ඉ. මූලික පරීක්ෂණ උසාවිය පත්කල නිළධාරියා හට උසාවිය මගින් ඉදිරිපත් කර ඇති මුපඋ වාර්ථාව පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි අවස්ථාවක නැවත සාක්ෂි ලබාගෙන අදාල කරුණු තහවුරු කරන ලෙස මුපඋ වෙත නියෝග කල හැක.

**මූලික පරීක්ෂණ උසාවි පත්කල යුතු අවස්ථා:**

අ. යුද හමුදා පනතේ 148 වගන්තිය යටතේ නීති විරෝධී නොපැමිණීම වෙනුවෙන්.

ආ. පොදු දේපලක් හෝ යුද හමුදාවට අයත් පහත දක්වා ඇති භාණ්ඩ/ද්‍රව්‍ය නැතිවීමක්/සොරකම් කිරීමක්/විනාශ වීමක් හෝ විනාශ කිරීමක් සම්බන්ධයෙන්:

(1) ගබඩාව

(2) ආයුධ හෝ උපකරණ

(3) රෙදි පිළි

(4) සැපයීම් ද්‍රව්‍ය

(5) ගොඩනැගිලි හෝ ඕනෑම ඉදිකිරීමක් සම්බන්ධයෙන්.

ඇ. මහජන හෝ ආරක්ෂක සේනා හෝ රෙජිමේන්තු මුදල් නැතිවීමක් හෝ ඌණතාවයක් සම්බන්ධයෙන්

ඈ. යුද හමුදා නිවස්නයකට හෝ ආයතනයකට අයත් මුදල් හෝ සැපයීම් ද්‍රව්‍ය නැතිවීමක් හෝ ඌණතාවයක් සම්බන්ධයෙන්.

ඉ. සියලුම ආකාරයේ පිපිරීම්, ගිනි ගැනීම් සම්බන්ධයෙන් හෝ එයින් සිදුවන අනතුරක් හේතු කොට ගෙන යම් අයෙකුට සිදුවන තුවාල වීම් හානිවීම් හෝ යම් දේපලකට සිදුවීම හානිවීම් සම්බන්ධයෙන්.

ඊ. යුධ හමුදාවේ අයවලුන් හට සිදුවන ශාරීරික තුවාල හෝ හානි සම්බන්ධයෙන් පහත දක්වා ඇති අවස්ථාවලදී.

(1) ඉතා බරපතල තුවාල සිදුවූ විටකදී හෝ වෛද්‍ය වරයෙකු විසින් එය බරපතල හෝ සාමාන්‍ය වශයෙන් බරපතල තුවාලයක් ලෙස සහතික කරන අවස්ථාවක.

(2) යම් තැනැත්තෙකුට තුවාල සිදුවීමේ හේතු සම්බන්ධයෙන් ඔහුගේ අණදෙන නිළධාරි හට සැකයක් ඇතිවූ අවස්ථාවක.

(3) යම් අයෙකුට තුවාල සිදුවූ අවස්ථාවක එම සිදුවීම රාජකාරියේ යෙදී සිටියදී/බැහැරව සිටියදී සිදුවූයේද යන්න පිළිබඳ අනි හට සැකයක් ඇතිවූ අවස්ථාවක.

(4) තුවාල සිදුවීම අන් අයෙකුගේ වරදින් හෝ නොසැලිකිලිමත් කමින් සිදුවූ අවස්ථාවක.

(5) තුවාල සිදුවීමේ හේතු සොයා බැලිය යුතු යැයි හැගෙන අවස්ථාවවකදී.

උ. නි/සෙසුනිළයෙකු සතුරන්ගේ යුද සිරකරුවෙකු බවට පත්වූ අවස්ථාවක.

ඌ. මූලික පරීක්ෂණ උසාවියක් පත්කිරීමට බලය ඇති නිළධාරියෙකු හට මූලික පරීක්ෂණ උසාවියක් පත්කල යුතුයැයි හැගෙන අවස්ථාවක.

**සාක්ෂි සටහන් කර ගැනීම**

අ. මුපළ එක යොමුකර ඇති කරුණු සොයා බැලීම සඳහා අවශ්‍ය කරන සියලුම සාක්ෂිකරුවන් කැඳවිය යුතුයි.

ආ. සාක්ෂි සටහන් කර ගැනීමට පෙර සියලුම සාක්ෂිකරුවන්ගෙන් එක් එක් ආගමානුකූලව පහත සඳහන් පරිදි දිවුරුම් ලබාගත යුතුයි.

**බෞද්ධ:**

මෙම උසාවිය ඉදිරියේ ලබාදෙන සාක්ෂිය සත්‍ය බවත්, සම්පූර්ණ සත්‍ය බවත්, සත්‍ය මිස වෙනත් යමක් නොවන බවත්, අවංකවත්, සත්‍ය ලෙසත් ප්‍රතිඥා දී ප්‍රකාශ කරමි.

**ක්‍රිස්තියානි/හින්දු/ඉස්ලාමීය ආගමිකයින්:**

මෙම උසාවිය ඉදිරියේ ලබාදෙන සාක්ෂිය සත්‍ය බවත්, සම්පූර්ණ සත්‍ය බවත්, සත්‍ය මිස වෙනත් යමක් නොවන බවත්, දෙවියන් වහන්සේගේ නාමයෙන් දිවුරා ප්‍රකාශ කරමි.

ඈ. මූලික පරීක්ෂණ උසාවිය සියලු සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්ණ අසා සාක්ෂිවල සත්‍ය අසත්‍ය බව තීරණය කර ගත යුතුයි.

ඈ. මුපඋ 15 (1) රෙගුලාසිය.

මුපඋ පත්වීමේදී මෙම රෙගුලාසි මාලාවේ 15 (1) රෙගුලාසිය සැලකිල්ලට ගත යුතු වැදගත් රෙගුලාසියක් වන අතර, ඒ අනුව යම් සාක්ෂිකරුවෙකු විසින් යම් හමුදා නිළධාරියෙකුගේ/සෙනියෙකුගේ ජීවිතයට බලපෑමක් වන ආකාරයේ හා යුධ හමුදාවේ කීර්තිනාමයට හානිවන ආකාරයේ සාක්ෂියක් ලබාදුන හොත් වහාම එසේ බලපෑම් සිදුවූ අයවලුන් මූපඋ ඉදිරියට කැඳවා අදාල සාක්ෂිකරුගේ සාක්ෂිය එම තැනැත්තා ඉදිරියේදී ලබාගත යුතුයි. එසේ සාක්ෂිකරු සාක්ෂි දීමෙන් පසු එම තැනැත්තා හට සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්ණ ඇසීමට අවස්ථාව සලසා දිය යුතුයි. එම කරුණුද ලිඛිතව සටහන් කර ගෙන ඔවුන්ගේ අත්සන ලබාගැනීමට ක්‍රියාකල යුතුවේ. යම් තැනැත්තෙකු සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්ණ ඇසීමට අවශ්‍ය නොවන බව ප්‍රකාශ කරන්නේ නම් ඒ බවද ලිඛිතව ලබාගෙන අත්සන් ලබාගත යුතුවේ. තවද නිශ්චිතව හඳුනාගත් පුද්ගලයෙකු, පුද්ගලයින්ට විරුද්ධව ඇති චෝදනා සම්බන්ධව සොයා බැලීම සඳහා මූපඋ පැවැත්වීමේදී සෑම සාක්ෂිකරුවෙකුට සාක්ෂි ලබාදෙන අවස්ථාවේ අදාල චූදිතයා/චූදිතයින් හට එම ස්ථානයේ රැඳී සිටීමට හා ඔවුන්ගෙන් හරස් ප්‍රශ්ණ ඇසීමට අවස්ථාව ලබාදිය යුතුවේ.

ඉ. මුපඋ සඳහා ඉදිරිපත් වන සියලුම සාක්ෂි කැඳවා අවසානයේ උසාවිය විසින් සොයාගත් කරුණු සම්බන්ධව සටහන් කල යුතුවේ.

ඊ. ශ්‍රීලයුපොහේබ වෙතින් සාක්ෂි ලබාගැනීම:

යම් මුපඋවක් පත්කිරීමට හේතුව, ශ්‍රීලයුපොහේබ මගින් සිදුකල විමර්ෂණයකින් පසුව ඒ සම්බන්ධයෙන් වැඩිදුරටත් සොයා බැලීමට අවශ්‍ය වීම හෝ චූදිතයින් වරද පිළිනොගැනීම නිසා නම් අදාල ශ්‍රීලයුපොහේබ වාර්ථාව සහ මුපඋ හි සාක්ෂිකරුවන් විසින් ශ්‍රීලයුපොහේබ වෙත ලබාදී ඇති ප්‍රකාශණවල පිටපත් ශ්‍රීලයුපොහේබ විමර්ෂණ කණ්ඩායමේ සුදුසු සාක්ෂිකරුවෙකු මගින් මුපඋ වෙත ලබාගත යුතුයි. අදාල සාක්ෂිකරුවන් මුපඋ වෙත ලබාදෙන ලද ප්‍රකාශ හා ශ්‍රීලයුපොහේබ වෙත ලබා දී ඇති ප්‍රකාශ පරස්පර විරෝධී නම් ඒ සම්බන්ධව ඔවුන්ගෙන් වැඩිදුර සාක්ෂි විමසා එම පරස්පර විරෝධතාවයට හේතුන් ලබාගත යුතුයි. සාක්ෂිකරුවන් පිළිගත හැකි හේතුවක් නොමැති ශ්‍රීලයුපොහේබ වෙත හෝ මුපඋ වෙත සාක්ෂි ලබාදී ඇත්නම් ඒ සම්බන්ධව විනයානුකූලව කටයුතු කිරීමට සිදුවන බවද ඔවුන් හට පැහැදිලි කර දිය යුතුයි. එසේම යම් ශ්‍රීලයුපොහේබ විමර්ෂණ රපෝර්තුවක කරුණු සම්බන්ධයෙන් වැඩිදුරටත් සොයා බැලීම සඳහා මුපඋ පත්කර තිබෙන විට මුපඋ සඳහා අවසන් නිගමනයක් ලැබෙන තෙක් විනයානුකූලව කටයුතු කිරීමට පියවර නොගත යුතු අතර, විශේෂිත අවස්ථාවලදී නීතිසේවාඅම වෙත දන්වා අනුමැතිය ලබාගත යුතුයි.

උ. මුපඋ සභාපති විසින් එම උසාවිය රැස් කිරීමට නියෝග කල නිළධාරියා වෙත උසාවිය ඉදිරියේ සාක්ෂි වශයෙන් ඉදිරිපත් කල සියලුම ලියකියවිලි භාරදිය යුතුයි.

ඌ. සොල්දාදුවෙකුගේ නීති විරෝධි නොපැමිණීමක් හේතුවෙන් මුපඋ පත්කර ඇති අවස්ථාවක එය ඉදිරියට පැමිණි, නොපැමිණි අය වෙනුවෙන් සාක්ෂි දීමට කැමැති අයවලුන් වෙතොත් ඔවුන්ගේ සාක්ෂි සටහන් කර ගත හැක.

එ. යුද හමුදා පනතේ 120 වගන්තියට අනුව නඩු විභාගයකට හැර උසාවිය ඉදිරියේ කැමැත්තෙන් සාක්ෂි දෙන බොරු ප්‍රකාශයක් කරනු ලබන පාපොච්චාරණයක් කරනු ලබන අවස්ථාවක එම ප්‍රකාශය එකී තැනැත්තාට විරුද්ධව යොදාගත නොහැකිය.

මුපළ වාර්ථාවේ පිටපතක් අදාල සෙබළාට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා මුදල් ගෙවීමකින් පසුව ලබාගත හැක. වචන 72 ක පිටුවක් සඳහා ශත 10 ක් අයකරනු ලැබේ.

**<u>සාක්ෂිකරුවන් කැඳවීම</u>**

මුපළ සඳහා සිවිල් පුද්ගලයෙකුගෙන් සාක්ෂි ලබාගැනීමට අවශ්‍ය වූ අවස්ථාවකදී ඔවුන් යුද හමුදා කඳවුරක් වෙත නොපැමිණෙන්නේ නම් ඒ සඳහා ඔවුන් හට පැමිණෙන ලෙස බලකල නොහැක. එහෙත් ඔවුන්ගේ සාක්ෂිය අත්‍යවශ්‍ය වන්නේ නම් ඔවුන් විසින් එකග වන ස්ථානයකදී අදාල සාක්ෂිය ලබාගත හැක. කෙසේ හෝ සාක්ෂි ලබාදීම ප්‍රතික්ෂේප කරන්නේ නම් මුපළ විසින් ඒ සම්බන්ධව මුපළ වාර්ථාවක් මුපළ වාර්ථාවට ඇතුලත් කල යුතුවේ.

මුපළවක් පවත්වාගෙන යාමේදී යම් හමුදා සාමාජිකයෙකුගෙන් මුදල් අයකර ගත යුතුයයි හැගෙන ආකාරයේ චෝදනාවක් එල්ල විය හැකි බව මණ්ඩලයට හැගීයන්නේ නම් එම හමුදා සාමාජිකයා හට මුපළ කටයුතු අවසන් වන තෙක් යුධ හමුදාවෙන් ඉවත්වීම සඳහා නිශ්කාශණ ලබාගැනීමට නොහැකි වන අයුරින් මුපළ විසින් පියවර ගත යුතුයි.

රුඃ ලක්ෂ 5කට වැඩි වටිනාකමකින් යුත් යම් අලාභහානියක් හෝ වංචාවක් සඳහා මුපළ පත්කිරීමේදී සැලකිය යුතු කරුණුඃ

මුපළ වක් පැවැත්වීමට පෙර පවත්වන ලද යම් පරීක්ෂණයක් මගින් එම සිදුවීමට අනුකූලව රුඃ ලක්ෂ 5 කට වැඩි මුදලක් වංචාවක්, දේපල හානියක් යම් පාඩුවක් හමුදාවට හෝ රජයට සිදුවී ඇති බව සොයාගෙන ඇත්නම් ඒ සම්බන්ධව සොයා බැලීම සඳහා පත්කරන ලද මුපළ වෙත අනිවාර්යයෙන්ම රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ නියෝජිතයෙකු පත්කල යුතුයි. එබැවින් එම සිදුවීමට සම්බන්ධව මුරෙ 104 (03) යටතේ ප්‍රාරම්භක වාර්ථාව සකස් කර පහත සඳහන් පරිදි රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කල යුතුය.

(අ) රජයේ දේපල හානියක් නම් උමාජේශා වෙතින්

(ආ) රජයේ මුදල් හානියක් නම් අයවැය හා මුපඅම වෙතින්

ඒ සමගම අදාල මුපළ සඳහා පත්කිරීමට මේජර් නිළයේ හෝ ඉන් ඉහල ජ්‍යෙෂ්ඨ නිළධාරින් දෙදෙනෙකුගේ නාමයෝජනාද ඉදිරිපත් කල යුතුයි. මෙම උපදෙස් රුඃ ලක්ෂ 5 කට වැඩි අලාභහානියක් සිදුවී ඇති ත්‍රස්ථවාදී ප්‍රහාර නිසා සිදුවන අලාභහානි හැර වෙනත් සෑම අලාභහානියක් සම්බන්ධවම අනුමගමනය කල යුතුයි. ත්‍රස්ථවාදී ප්‍රහාර හේතුවෙන් සිදුවන ඉහත සඳහන් මුදලට වඩා වැඩි වටිනාකමකින් යුත් නැතිවීම්/අලාභහානිවීම් වෙනුවෙන් හවනි 29/94 හි උපදෙස් පරිදි ක්‍රියා කල යුතු වේ.